සුබස් සිතිවිලි

වි ක ධර්මබන්ධු

තද්දිත ප්‍රත්‍යාවලියට -ල - ර" දෙකත් එකතුවිය යුතුය. ප්‍රකෘර්තියක් අගට යෙදී සංග්‍රහ ප්‍රකෘර්තියක් නිපදවන්නේ -ප්‍රත්‍යය" බවත්, ප්‍රකෘර්තියක් අගට යෙදී එය පදයක් කරන්නේ -විබක්තිය" බවත් කුමාරතුංග මුනිදාසයෝ පවසති. වියරන පොත් වල -තද්දිත නාම සහ කෘදන්ත නාම " යනුවෙන් හැඳින්වෙන්නේ -සංග්‍රහ නාමයි".

'ගමි' යන ප්‍රකෘර්තිය අගට යෙදු -ඉ" යන්න -ප්‍රත්‍යයකි". එවිට ගමි ඉ = ගමි = ගැමි යන සංග්‍රහ ප්‍රකෘර්තිය හැදේ. එසේ හැදුනු -ගැමි" යන සංග්‍රහ ප්‍රකෘර්තියට ආ - එක් - අකු - ඕ - අන් ආදි - විබක්තියක්" එකතු කල විට හැදෙන්නේ (සංග්‍රහ) නාම පදයකි.

'ගමි' ප්‍රකෘර්තියට අ - ඒ - ඉන් - අක් ආදි විබක්ති එකතු වි හැදෙන්නේ ගම - ගමේ - ගමින් - ගමක් ආදි පද බවත්, -ගැමි" ප්‍රකෘර්තියට ආ - එක් - අකු - ඕ - අන් ආදි විබක්ති එකතු වි හැදෙන්නේ ගැමියා - ගැමියෙක් - ගැමියකු - ගැමියෝ - ගැමියන් ආදි පද බවත් ඔබ දනිති.

-ඔබ" යන්නට -දනී" වැනි ඒකවචන ආඛ්‍යාතයක් නොයොදන්නේ -ඔබ" යන්න ඒකවචන සහ බහුවචන යන දෙකට ම පොදු වචනයක් නිසා ය. ඉංගිරිසියේ (යු) ශබ්ද මිස ශබ්ම් නැති විදියට අපේ -ඔබ" බාවිතා වේ. -ඔබලා" බාල - බොලඳ

-කොර" (පොතු) නාම ප්‍රකෘර්තියකි. එයට - ල" ප්‍රත්‍යය එකතු වි -කොරල" යන සංග්‍රහ නාම ප්‍රකෘර්තිය හෙවත් තද්දිත පදය හැදේ. කොරලය - කොරලයා - කොරලියා ආදී වශයෙන් එය වරනැගේ.

-අඩ" (තිත්ද) යනු නාම ප්‍රකෘර්තියකි. එයට - ල" ප්‍රත්‍යය එකතු වි -අඩල" (පොල් අඩල) යන සංග්‍රහ නාම ප්‍රකෘර්තිය (තද්දිත පදය) හැදේ. අඩලය - අඩලයක් ආදී වශයෙන් එය වරනැගේ.

-අස" (බඩ) යනු නාම ප්‍රකෘර්තියකි. එයට - ල" ප්‍රත්‍යය එකතු වි -අසල" යන සංග්‍රහ නාම ප්‍රකෘර්තිය (තද්දිත පදය) හැදේ. අසලට - අසලින් ආදී වශයෙන් එය වරනැගේ.

මේ නිදසුන් විමසීමේ දී සංග්‍රහ නාම (තද්දිත) නිපදවීම සඳහා -ල" යන්න ද යෙදෙන බව පෙනේ. ආරච්චි ල - ආරච්චිල, නාකන්ද ල - නාකන්දල, (ඇහැලියගොඩට නුදුරු ගමකි. එතමින් පෙලපත් නමක් ද ඇත.) නා කඳ දොල කොස් කඳ වල යන නම්වල ඇති -කඳ" යන්න -කන්" විය හැකි බව පෙනෙනත් - නාකන්ද" ම -නාකන්දල" වී ඇතැයි සිතමි.

ඉස් අළ - ඉසළ - ඉහළ, පා අළ - පහළ වි ඇතැයි කුමාරතුංග මුනිදාසයන් කියා ඇත. -අළ" යනුවෙන් ප්‍රත්‍යයක් ඔවින් දැක

වචනයකි.

-ගමි" ප්‍රකෘර්තියට ම -අ" ප්‍රත්‍යය එකතු වීමෙනි, එය ගමි අ = ගම වන්නේ. ඒ සංග්‍රහ නාමයත් ගම ආ = ගමයා, ගම එක් = ගමයෙක්, ගම ඕ = ගමයෝ ආදි වශයෙනි, වරනැගෙන්නේ. රටුන් / රැටියෝ - නුවරුන් /නුවරු / නුවරනු වැනි පදත් ඒ විදියටම හැදුනු ඒවායි.

-විබක්ති" යන වචනය ඔබට අවිලක් විය හැකිය. සමහරු -විබක්ති ප්‍රත්‍ය" යනුවෙන් එය හඳුන්වතත් -විබක්ති" යනුවෙන් හැඳින්වීම වඩාත් උචිත ය. කර්ම විබක්තිය කරන විබක්තිය ආදි වශයෙන් අපට උගන්වා ඇති හෙයින් ඒ අවිල ඇති වෙතත් ඒ තැන්වල ඇත්තේ කර්ම විබක්ති අර්තයත් කරන විබක්ති අර්තයත් ය. -ඒ" යන විබක්තිය නිසා ය, ගම් ඒ = ගමේ යන්න සම්බන්ද විබක්ති අර්තය හෝ අදර විබක්ති අර්තය ඇති පදයක් වන්නේ.

එ - මෙ - ඔ - කො යන ප්‍රකෘර්ති වලට අගට යෙදු -ඔ" යන්න ප්‍රත්‍යයකි. එවිට එ ඔ = ඔබ, මෙ ඔ = මොබ, කො ඔ = කොබ ආදි සංග්‍රහ නාම ප්‍රකෘර්ති හැදේ. ඒ ප්‍රකෘර්ති විවිද ආකාරයට වියහර වේ. එයා - මෙයා - ඔයා (කොයා) එක් විදියකි; එහි - මෙහි - ඔහි (ඔහේ) - කොහි තවත් විදියකි. එහේ - මෙහේ - ඔහේ - කොහේ තවත් විදියකි.

-ඔබ" යන්න කතා බහේ වියහර වන්නේ ඔහේ - ඔයා - උඹ - උඹැහේ ආදි වශයෙනි. ප්‍රතම පුරුශයේ දී එ හු = ඔහු වන පදය දෙවන පුරුශයේ දී ඔබ (නුඹ - ඔයා - ඔහේ) වේ. -මොහු" යන්න ප්‍රතම, දෙවන, උත්තම පුරුශ තුනින් කුමකට අයත් දැයි මට නිනව්වක් නැත. ඔහු - ඔබ - මම යන පද තුන පුරුශ තුනට අයත් ය.

සිය බසේ සංග්‍රහ නාම නිපදවීම සඳහා ප්‍රත්‍ය විසි තුනක් (23) බාවිතා වන බව කුමාරතුංග මුනිදාසයන් පෙන්වා දී ඇත. මට පෙනෙන හැටියට නම් -ර - ල" යන ප්‍රත්‍ය දෙකත ඒ ප්‍රත්‍යාවලියට එකතු විය යුතුය.

ඇත. -අළ" ප්‍රත්‍යය යෙදී හැදුනු වෙනත් පදයක් සොයා ගත නොහැකි විය. ඉස් අල = ඉසල වැනි පදයක් හෝ -ඉහ" යන්න - ඉහ්" වන තැනක් හෝ නැති නිසාත්, ඉහළ - පහළ යන දෙතනට සීමා වූ -අළ" ප්‍රත්‍යය ගැන සැකයක් මට ඇත.

පහල ම -පල්ල" වන තැන් රැසක් දක්නට ලැබේ. මූර්දප් -ළ" යන්න දන්තප් -ල" වීමට රීතියක් ඇද්දැයි නොදනිමි. වෙල්පල්ල - දම්පල්ල (පැල්ල) හොරම්පල්ල (පැල්ල) - පල්ලෙවෙල - පල්ලේකැලේ - පල්ලෙගම - පලල්මහයාව යන තැන්වල -පහල" ම - පල්ල" වි ඇතැයි සිතමි. පහළ කිසි විටක - පළ්ළ" නොවේ. උඩ අහ = උඩහ, පහල අහ = පල්ල අහ = පල්ලෙහ = පල්ලෙහා යන්නෙන් ද එය තහවුරු වේ.

-දිය" යනු ප්‍රකෘර්තියකි. දියේ - දියෙන් - දියට යනුවෙන් එය වරනැගේ. දියට -ර" එකතු වි -දිය ර = දියර" හැදේ.

-කුස" යන්නේ අදහස -හිස් තැන" යන්නයි. - අහස් කුස" යනු හිස් අහසයි. -සුරන් සහ සහසැස් - නොකර සිටියේ අහස් කුස් හිස්" යන අඩගීයට අනුව අහස් කුස හිස් තැනක් බව පැහැදිලිය. -හිස්" මිනිසුන් කුස පුරවන - බස් දොඩවන - බොජුන් මේස මත ... සුවඳ හලන්නට -...." යන තැන ද කුස හිස් තැනක් බව පෙනේ. පිරුනු තැන් යලි පිරවිය නොහැක. -උදර කුහරය" ද මෙහි දී සිහියට එයි. ඒ අනුව -කුහර" හැඳි ඇත්තේ කුසට - ර" එකතු වීමෙන් යයි සිතමි.

-වස්" (සියවස) යනු ප්‍රකෘර්තියකි. වසින් - වසක් ආදි වශයෙන් එය වර නැගේ. වසට - ර" එකතු වීමෙන් -වසර" හැදී ඇතැයි සිතමි. එය වසරින් - වසරට ආදි වශයෙන් වරනැගේ.

මේ නිදසුන් අනුව -ල - ර" යන ප්‍රත්‍ය දෙකත් ඒ ප්‍රත්‍යාවලියට එකතු කල යුතු අතර -අළ" ප්‍රත්‍යය එයින් ඉවත් විය යුතු නිසා ප්‍රත්‍ය සංඛ්‍යාව (23 - 1 2) විසි හතරක් වීම යුතුය.

(මේ ලිපිය ගැන අදහස් දක්වන්නේ මැනවි)

සුභාෂිතයෙන්.....

සඳුන් කපුරු සමගින් පිති දිය නොමඳ
සොඳින් කලල් කරමින් සුවඳ මුවමඳ
හිතින් හිම'ඹ ඉස ඉස ලුහුනු වැව්වද
තමන් ගුනය නොහරින වැනි දුදන හඳ

එය ම ගැදිපැදියකින් :

සඳුන් කපුරු (සහ)
සුවඳ (ඇති) මුවමඳ
නොමඳ පිති දිය සමගින්
සොඳින් කලල් කරමින්
හිමඹ
හිතින් ඉස ඉස
ලුහුනු වැව්වද
(ඒ ලුහුනු)
තමන් ගුනය
නොහරින වැනි (ය)
දුදන හඳ (ත්).

එහි අදහස :
සඳුන් සහ කපුරුත්, සුවඳැති කස්තුරිත් (බොහෝ) පිතිදිය හා හොඳින් කලතා (එයත්), හිම දියත් නොකඩවා ඉසිමින් වැවූ ලුනු තමන්ගේ (සැර) ගතිය වෙනස් නොකරයි.

එ සේ ම දුදහනුත් කිසි විටක තමන්ගේ දු ගුන (දුර්ගුන) වෙනස් කරන්නේ නැත.

විසිතුරු: මෙහි කියැවෙන දෑ යොදා වචන ලුනු වගාවක් තබා මිරිස් වගාවක් උවද ඉතිරි වේ ද යන්න සැක සහිතය. අඟරත් ලුනු, මිරිස්, ඉඟුරුවල සැර ගුනය ඉවත් කිරීමට දගලන පිස්සා කවරෙක් ද? අනියත් හෙවත් රටලුනු එන්නට පෙර අපට තිබුනේ රතු ලුනුත්, සුදු ලුනුත් ය.

මෙහි සඳහන් වන්නේ රතු ලුනු යයි සිතමි. අපේ වෑංජනවලට බෙහෙවින් එකතු වන්නේ රතුලුනුය. සුදු බතල, කහ බතල, දම් බතල ඔබ දැක ඇත. බීට් වැනි රතු බතල නිපදවීමට ඇත්නම් ?

පිතිදිය යනු 'පිති' ම සඳහා යෙදිය හැකිය. හබරල කොලයට වැටෙන පිති එකතු කල විට පිතිදිය හැදේ. විකිනීමට තබා ඇති පිතිදිය හදා ගන්නේ කෙසේ දැයි මම නොදනිමි. පිතිදිය බෙලිමලින් පෙරා ගන්නා දියරක් බව සමහරු කියති.

හිමඹ යවු හිම අඹ (හිම සහ ජලය) යන දෙ පදය එකතු වීමෙන් සෑදී ඇත. මෙහි අදහස වන්නේ හිම දියවීමෙන් හැදෙන සීතල වතුර ද, හිම මෙන් සීතල වතුර ද යන්න පැහැදිලි නැත. ලංකාවේ දී අප හිම දැක නැත. එහෙත්ත් ඉතා සීතල වතුර ලෙස ගැනීම හිවැරැදි යයි සිතමි.

මුවමඳ මා දැක නැත. එය දුම්මල හෝ සාම්බ්‍රානි වැනි ගන වූ දෙයක් යයි සිතේ. කස්තුරි මුවාගේ මඳ මිඳී හැදුනු දෙයක් ද ? මම නොදනිමි.

සමඳගල ඇතුන් හය පළකින් මඳ වැගිරෙන ඇතුන් ගැනත්, තිමඳගල ඇතුන් තුන්පළකින් මඳ වැගිරෙන ඇතුන් ගැනත් අසා ඇත්තෙමි. ඒ මඳ වැගිරෙන තැන් කවරේ දැයි කියන්නට මම නොදනිමි.

මඳ කිපුනු බැලලියන්, බැලලියන්, ඊරියන්, එලිස්සන්, එළ දෙනුන් ඇතින්නත් දැක ඇත්තෙමි. උන්ගේ යෝනියෙන් බිත්තර සුදු මදය වැනි උකු දියරයක් වැගිරෙනු ද දැක ඇත්තෙමි. පිරිමි සතුන්ටත් සෘතු වීමට කාල සීමාවක් ඇත්දැයි නොදනිමි.

කිරි දිය, පිති දිය, හිම දිය (හිමඹ), කෙස් ගහ, කොඩි ගහ, මෝල්ගහ, අලගෙඩිය, ලුනු ගෙඩිය, බිත්තර ගෙඩිය, බඩ ගෙඩිය, පාං / බතිස් / කේක් ගෙඩිය යන වියහර ගැන සිතන්න.

මන්තරයක් අත්හදා බලමු ද ?

ලංකාවේ අප බොහෝ දෙනාගේ ජීවිත හා බැඳී තිබුනු යන්ත්‍ර මන්ත්‍ර (යතුරු මතුරු) යාග හෝම, තොවිල් පව්ල් යුගය අවසන් වී ඇතැයි සිතා සිටියෙමි. එහෙත් මා වැරදි බව මට තේරුම් ගියේ පසු ගිය දා ලංකාවට ගියවිටය. බූතයකු වැසී සිටි අපේ මිනිබිරියක සඳහා තොවිලයක් විය. -සැබෑ බූතයා සොයා සාන්ති කර්මයක් කරන්නැ"ය් කිමට හිතුන නමුත්, දෙ තුන් දෙනෙකුගේ ම හිත තලා දැමීමට අකමැති වූ මම මුනිවත රැක්කෙමි.

මින් හැට දෙ වසරකට පමන පෙර සිදුවීමක් අද මගේ මතකයට ආවේ මා "මහා" පොතක් කියවමින් සිටියදී ය. එහි නම "මහා මන්ත්‍ර විද්‍යාව" ය්.

ඒ 1948 - 1950 අතර දිනයක් විය යුතුය. එප්පු මාමාගේ පොල් මැස්ස යට උනුනුමට බල්ලෙක් ලඟ සිටියේය. මා එතැනින් යන විට ඌ මා වෙත කඩා පැන්නේ ය. බියෙන් තැති ගත් මම අසිහියෙන් මෙන් උගේ ඔලුව අල්ලා ගත්තෙමි. මට අහු උනේ උගේ කට හරියෙනි. මම උගේ හොම්බ (කට) එතැන තිබූ පොල් මුලේ ඇන්නෙමි. අසිහියෙන් කල නමුත් මම උගේ හොම්බ හත් අට වරක් පොල් මුලේ ඇනී ඇති බව මතකය. මා කෑ ගැසූ බවක් මතක නැත. බල්ලා නම් මර හඬ දුන්නේ ය. මම ඌ අත හැරියෙමි. ඌ මට බනිමින් බෙරිහන් දෙමින් පැන දිව්වේ ය.

උගේ දතක් වැදී මගේ දකුනු අල්ලෙන් ලේ ගලන්නට විය. මම ආ පසු ගෙදර දිව්වෙමි. ආත්තා ඉගේ අත ගසා ගත්තාය. චිත්තයක් ඉනේ දවටා ගත්තා ය. -යමං යමං" -කොහේද ආත්තේ ?" - නන්දියස් අප්පු මුත්තලෑ ගෙදර්". අප එහි යන විට නන්දියස් අප්පු මුත්තා බුලත් විටක් කොටමින් සිටියේ ය.

"නන්දියස් අය්යේ, බල්ලෙක්.." ආත්තාට කියන්නට ලැබුනේ එපමනකි. මුත්තා බුලත් කෙටීම නවතා ගෙට ගියේය. ඔහු ආපසු ආවේ පිරිසියකුත් අර ගෙන ය. එහි තිබුනු පොල් තෙල්, කහ, සියල් දුඹුල (සියල් දුඹුල් යනු කුස්සියේ දුමේ යටි පැත්තේ හැදෙන දුම් ගැටිති ය) ඇඟිල්ලෙන් මුසු කොට තුවාලයේ ගාමින් මැතිරුවේය; විනාඩි පහලොහක් විස්සක් පමන මැතිරුවේ ය. මට හිතුනේ මතුරා ඉවර වන විට තුවාලය පෑස්සී ඇතැයි කියා ය. එක ම මන්තරය යලි යලිත් කියවෙන බ වමට තේරිනි. ඔහුගේ උපදෙස් අනුව එහි ගොස් තවත් හය වරක් (එකතුව හත් දොහකි) මතුරවා ගත්තෙමි. තෙල් මිසුනයේ වේලුනේ බල්ලාට පිස්සුව නොතිබුනු නිසා ද ? තෙල් මිසුරනයේ බලය නිසා ද ? මන්තරයේ බලය නිසා ද? යනු නොදනිමි.

බල්ලකු විසින් සපා කනු ලැබූ මගේ ලොකු පුතාගේ බුරිය වටා බෙත් විදුම් 21 ක් කරන විටත් මට නන්දියස් මුත්තා සිහි විය. එවිට ඔහු මියැදී සිටියේ ය. ආත්තා ද ඔහු සමග විය. ඔවින් දෙ දෙනා සිටියත් අප එදා ඔහු වෙත නොයනු ඇත.

කෙසේ වෙතත් අප ආ ගමනේ පියවර සටහන් ලෙස සැලකිය හැකි යන්ත්‍ර මන්ත්‍ර ගැන විමසුමක් කිරීම තේරුමක් නැති වැඩක් නො වේ. එක්කෝ-අපට ඒවා කියවා සිතාසිය හැකි ය. එසේ නොවේ නම් එහි බාසාව එදා ඇදහිලි සහ විස්වාස ගැන අවබෝදයක් ලබා ගත හැකිය. අත්හදා බැලිය හැකි ය.

ඉහත කී සිද්දියෙන් පසු කිසි දා ක මම යන්ත්‍ර මන්ත්‍ර වල පිහිට නොපැතුවෙමි. මට වැදගත් වන්නේ එහි බසාවත් එදා ඇදහිලි සහ විස්වාසත් ය. පාලි - සකු - දෙමල වචනත් අප නොදන්නා බාසාවක වචනත් යොදා පබඳා ඇති මන්තරවල සාහල බාසාව අවිරුදු දෙ තුන් සීයයකට වඩා පරනි නොවන බව පෙනේ. මගේ නිනව්ව නිවැරදි දැයි සිතා බලන්න.

අදඳ පි -බලු කෑ වනයට" මන්ත්‍රයකුත් තවත් මන්ත්‍ර දෙකකුත් හඬ නොනඟා හිතින් කියවමු. වැරදීලා වත් කටින් කියවා මොකක් හෝ විපිරියාසයක් උනොත් -මලකෙලියක් " නොවැ ! පොතේ ඇති පදත් අකුරුත් ඒ විදියටම මෙහි ලියා ඇති බව සලකන්න.

බලු කෑ වනයට (තුවාලයට ද ?)

"ඕං සී සී නන්ද නයිරේ පෝඩුන් පෝඩුන් පො ඃ"

පොල් තෙල් 108 වරක් මතුරා ගාන්න. තුවාල නොපැසවා (ළ) වේලෙයි. (ඔලිව් තෙල් උනත් වරදක් විය නොහැකි යයි සිතමි.

ඉසේ කැක්කුමට (පැහඩෝල් පො :)

"ඕං ශ්‍රී ධිරනාය ප්‍රචණ්ඩ ගෝපාය උගුරුලාය හර හර සුරු සුරු හේරු මස්ත කයිලාස කූට පුත්‍රයා නම ඃ" 108 වරක් (පොල් ?) තෙල් මතුරා ගාන්න.

බඩේ කැක්කුමට (රුදාවට)

"නමෝ නික්ක මංතං සාරි පුත්තං මහා මොග්ගල්ලානේ යාව ජීවං අරහන්තෝ ඒස්වහා" 21 වක් වරක් තල තෙල් මතුරා බඩේ ගාන්න. කෝපි හෝ සුදුසු කසායක් මතුරා දෙන්න. වදකහ කැටිලුනු (ලුනු කැට ?) කබලක ලා අළු වෙන තුරු බැද, උනු වතුරෙන් වත්කර, එය නිවෙන තුරු මතුරා බොන්නට දෙන්න. සුව වේ.

ස්ත්‍රීන්ට ඔසප්වීමේ දී සෑදෙන බඩේ කැක්කුමට

අමු ඉඟුරු සුදු ලූනු කොට දිඹුලා දළු සම භාග ගෙන කොටා, කොට දිඹුලා කොළයක ඔතා උණු අළු පල්ලේ ලා තම්බා ගෙන දෙසි ඇඹුල් බහා ඉහත කී මන්ත්‍රයෙන් 21 වරක් මතුරා බොන්නට දෙන්න. (මේ පිය හැකි, මිසුනයක් නොවේ. කිසි යම් දියරයකට මිසු කොට පෙරා ගත යුතු යයි සිතමි. එසේ නැත් නම් කටේ ගා ගෙන විත් විකමින් ඉස්ම ගිලිය යුතුය.) ආර්ථව ශුලය නිෂ්ඨාවට සුව වේ. කොට දිඹුලා දලු සොයා ගත නොහැකි නිසා මේ රටේ (ලංකානු) ස්ත්‍රීනට මේ (වෙදකම) ගුරුකම කරවා ගත නොහැකි ය.